## 341 ජේසුනි ජේසුනි

1. ජේසුනි ජේසුනි සමාව දෙනුව සදා

පුන ගැයුම: සාමය පාමින දයාවි වඩිනු වහා

2. ප්‍රේමයෙ සේසත නගාම ජේසු දයා
3. රෝගිවූ පාපිවූ සැමාගෙ සුවය පතා
4. ජීවන පූපය සැමාගෙ හදට බෙදා
5. ජේසුනි ජේසුනි සැමා'ප හදෙහි වෙලා
6. මැලි වූ දෑසට පෙනීම දෙමින සදා
7. ජීවය මාර්ගය සැබෑව ඔබය දයා
8. ප්‍රේමය ආදිවූ දෙවාය දම් සුගුණා

1. පාමින ආදර අනාථ අපව හදා

පුන ගැයුම: ප්‍රසාද දී යනු අපේම හදට වැදා

2. පාපෙන් සැදුන තුවාල හදෙහි බලා
3. ලේ සිඳ ජීවිත කපාල කන්දෙ පුදා
4. ආහර වේමය ඔබේම සිරුර අමා
5. ජීවිත සාරය සදාම ලැබෙන ලෙසා
6. යාමඟ යාමට දැනීම සතට දෙවා
7. ජේසුනි ජීවිත පිදීම ඔබගෙ බලා
8. ආසිරි පාමින ම ජේසු දේව මහා